චක්‍රලේඛ අංක :- 15/2013

මගේ අංක: ඩබ්/08/බලපත්‍ර
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.03.14

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර අධිකාරීන් වෙත,

**<u>බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීම/ සිරකරුවන් නිවාස නිවාඩු යැවීම</u>**

ඉහත කරුණට අදාලව මගේ අංක ඩබ්/08/බලපත්‍ර හා 2013.02.08 දිනැතිව නිකුත් කර ඇති අංක 09/2013 චක්‍රලේඛය සඳහා ඔබගේ අවධානය යොමු කරමි.

02. කාන්තාවන් හා ළමයින් සම්බන්ධයෙන් සිදුවන විවිධ අපරාධ වැඩිවෙමින් පවතින බවට සමාජ මතයක් පවතින බැවින් එවැනි වරදවල් වලට සිරදඬුවම් ලබන්නන් සම්බන්ධයෙන් සහන ලබාදීම තවදුරටත් එම තත්වය වර්ධනය වීමට හේතුවක් වියහැකි බව හඳුනාගෙන ඇත. ඒ අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජදීර අමාත්‍යතුමාගේ නියමයට අනුව එවැනි වරදකරුවෙක් සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙසට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම් අංක MRPR /03/05/12/10 හා 2013.03.08 දිනැති ලිපියෙන් උපදෙස් දී ඇත.

03. ඒ අනුව ඉහත කී චක්‍රලේඛයේ අංක 04 - I, II වගන්ති මින් අවලංගු කරන අතර මෙපරිදි සංශෝධනය කරමි.

I. 2013.01.01 දිනට පෙර ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර චෝදනා සම්බන්ධයෙන් සිරදඬුවම් ලැබූ වරදකරුවන් ඔවුන්ගේ පූර්ව ක්‍රියාකලාපය පරිදි වරදේ අල්ප බව හෝ බරපතලකම, වරදට පොළඹවීම, වරදට අදාල වර්තමාන පසුබිම සහ සමාජ ආකල්ප ගැඹුරින් සැලකිල්ලට ගෙන මින් ඉදිරියට බලපත්‍ර මත මුදාහැරීමට හෝ නිවාස නිවාඩු යැවීම සිදුකල යුතුය.

II. 2013.01.01 දිනෙන් පසුව ස්ත්‍රී දූෂණ හා ළමා අපචාර චෝදනා සම්බන්ධයෙන් සිරදඬුවම් ලැබූ වරදකරුවන් බලපත්‍ර මත මුදාහැරීම හෝ නිවාස නිවාඩු යැවීම අත්හිටුවා ඇත.

මින් ඉදිරියට මෙම නියෝග පිළිපදිමින් ක්‍රියාකරන ලෙසට ඔබගේ සුභසාධක නිළධාරීන්ට උපදෙස් දෙන මෙන් දන්වමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත් :-
01. බන්ධනාගාර කොමසාරිස් (කේ අංශය)
බන්ධනාගාර මූලස්ථානය

02. බලපත්‍ර මණ්ඩලය
බන්ධනාගාර මූලස්ථානය

කාරුණික දැනගැනීම සහ ක්‍රියා කිරීම සඳහා